ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2008/09

ඉඩම් නීතිය - **LWU 3312**

කාලය - විනාඩි 40

දිනය - 2008.10.13 වේලාව - පෙ.ව. 11.30 - ප.ව. 12.10 දක්වා

අපැහැදිලි අත් අකුරුවල ට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. "මුහුදු වෙරළේ හෝ මුහුදු වෙරළ ට ආසන්න රජය ට අයත් ඉඩම්වල මාළු දැල් එලීම සඳහා ධීවරයන් ට බලපත්‍ර ලබා දීම, රජය මගින් පත්කළ නියෝජිතයන් මගින් සිදු කිරීම සඳහා රජය ට බලතල ඇති බව ට මාහට කිසිදු සැකයක් නැත. ඉඩම් භාවිත කිරීම සඳහා ප්‍රකාශිත හෝ ව්‍යංග බලපත්‍රයක් රහිතව එම ඉඩම් ධීවර කර්මාන්තය සඳහා භාවිත කිරීම සාධාරණ බව මට පෙනී යන අතර එසේ නොවුවහොත් ධීවර කර්මාන්තය කළ නොහැකි වනු ඇත."

ලොරි වැ.බ.ආ.වි. රොවෙල් මුදලියාර් එ. පීරිස් (1895) 1 න.නී.වා.81 හිදී

විවිධ දේපළ වර්ගීකරණයන් සහ ඒවා මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ඉඩ සලසා ඇති ආකාරය පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

02. සරු පොල් එළදාවක් සහිත අක්කර 5 ක ඉඩමක් සහ නිදන කාමර 7 ක් සහිත විශාල නිවසක් හිමි පෙරේරා ට එම නිවස හා දේපළ විකිණීමට අවශ්‍ය විය. සති අන්ත පුවත්පතක එම දේපළ විකිණීම සඳහා ඇති බව ප්‍රචාරය කළ අතර අනාගත ගැනුම්කරුවන් ගෙන් සුදුසු මිළ ගණන් පෙරේරා ඉල්ලා සිටියේය.

මෙම දැන්වීම කියවීමෙන් පසුව සිල්වා එම නිවස හා දේපළ මිළදී ගැනීමට ඇති චේතනාව පෙරේරාට දැන්විය. සිල්වා නිවස හා දේපළ පරීක්ෂා කිරීමෙන් පසුව ගණුදෙනුව සඳහා අවශ්‍ය ලියවිලි අත්සන් කළේය. එම ලියවිලි අත්සන් කරන අවස්ථාවේදී පෙරේරා සිල්වා ට දන්වා සිටියේ නිවසේ ඇති "සියළුම තාවකාලික තිරවුරු " ඉවත් කර ගන්නා බවය. සිල්වා එයට එතරම් අවධානයක් යොමු නොකළේය.

සිල්වා සති දෙකකට පසුව නිවසේ පදිංචිය සඳහා පැමිණි විට දැක ගත හැකි වූයේ පෙරේරා විසින් නිවසේ සියළුම නාන කාමර කට්ටල, සිවිලින් විදුලි පංකා, මුළුතැන්ගෙයි රාක්ක, අතේ ගෙන යා හැකි විදුලි උඳුන, ජනෙල් හා දොරතිර සහ වටිනා බිත්ති සැරසිලි ඉවත් කරගෙන ඇති බවයි.

ශ්‍රී ලංකාවේ දේපළ නීතිය යටතේ ඉහත සඳහන් ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට පෙරේරාට යම් නෛතික අයිතියක් ඇත්දැයි සිල්වා ට දැන ගැනීමට අවශ්‍ය වී ඇත.

(ඔබ විසින් ඔප්පු ලිවීම පිළිබඳ නීතිය, ඉඩම් ගණුදෙනු හෝ අයිතිය පැවරීම් පිළිබඳ නීතිය සාකච්ඡා කළයුතු නැත.)

සිල්වාට උපදෙස් දෙන්න.

අදාල නඩු තීන්දු ඇසුරෙන් ඔබගේ පිළිතුර සපයන්න.

\- හිමිකම් ඇවිරිණි. -